Living the LOTUS
Buddhism in Everyday Life
11 2020
VOL. 182

## Founder's Essay

# සෑම හමුවීමක්ම උතුම්ව සලකන්න

මේ ලෝකයේ සෑම දෙයක්ම ඇසි පිය හෙලන සැනින් වෙනස්වන බව දැනගෙන සිටියද, එය හොඳින්ම ශරීරයට බද්ධ වන්නේ නිශ්චිත වයස් සීමාවකට පැමිණීමෙන් පසුවයි.

ඒ වෙනතෙක්, ඕන වෙලාවක ඉගෙන ගන්න පුළුවන්, ඕන අවස්ථාවක බලන්න පුළුවන්, ඕන වෙලාවක හමුවීමට පුළුවන් යනුවෙන් සිතා එදිනෙද තිබෙන වැදගත්කම හා හමුවීම් වල වටිනාකම ගැන නොසලකා ජීවත් වන අවස්ථාවන් විශාල නොවේද.

දෝගෙන් නම් සෙන් ගුරුතුමාගෙන් එක් මනුෂ්‍යයෙකු මෙසේ විමසා සිටියා, 'ධර්මය ඉගෙන ගැනීමට සිත යොමු කර වසර කිහිපයක් ගත වූවත්, හුදෙක්ම ධර්මාවබෝධ ලබා ගැනීමට නොහැකි වුනා ඒ මන්ද' යනුවෙනි.

එවිට දෝගෙන් ගුරුතුමා පිලිතුරු දෙමින්, 'එය තීරණය වන්නේ නියමාකාරයෙන් උනන්දු වනවාද, නැතිද යන කරුණ මතයි. නියමාකාරයෙන් උනන්දු නොවන්නේ, ලෝකයේ සෑම දෙයක්ම අනිත්‍ය බව තවමත් ශරීරයට බද්ධ වී නොමැති නිසයි' ලෙසින් පවසා සිටියා.

එබැවින්, පවුලේ සියළු සාමාජිකයන් ගැන, දිනපතා ඇතිවන සිදුවීම් ගැන හා ධර්ම මන්දිරයේ හමුවන නොයෙකුත් පුද්ගලයන් ගැන නැවත වතාවක් සිතා බලමු.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 9, P. 274-275


Living the Lotus
Vol. 182 (November 2020)

Senior Editor: Koichi Saito
Editor: Kensuke Osada
Copy Editor: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email:
living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



*President's Message*

# කෘතවේදීත්වය පැවසීමට හැකිවීමෙන් ලැබෙන සතුට

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## සතුටින් පිරි හදවත

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 'සතුටින් පින් අනුමෝදන් කිරිම' 18 වන පරිච්ඡේදයේ යෙහි, ධර්මය අසා හදවතින්ම සතුටට පත්වන පුද්ගලයා, එම සතුට තව පුද්ගලයෙකුට පැවසීමෙන් ලැබෙන ආනිශංස ගැන සදහන් වේ. ධර්මය ශ්‍රවණය කර, හදවතින්ම 'කෘතවේදියි' ලෙසින් භාරගන්නේ නම්, එය තව කෙනෙකුට පැවසීමට අවශ්‍ය වේ. ඒ ආකාරයට පුද්ගලයාගෙන් පුද්ගලයාට එම කෘතවේදීත්වය හා සතුට ප්‍රකාශනය වී, පනස් වෙනියට එම ධර්මය අසන පුද්ගලයාටද 'කෘතවේදී' බව දැනෙන්නේ නම් එහි ආනිශංස ඉමහත්ය. එසේම, පළවෙනියට එම ධර්මය අසා සතුටට පත්වූ පුද්ගලයා ලබන ආනිශංසද අපමණ බව 'පනස් වන පුද්ගලයා දක්වා ධර්මය කියා දීමෙන් ලැබෙන ආනිශංස' වලින් කියාදෙයි.

'සතුට' යන වදන තුල, 'අන්‍යයන්ගේ යහපත් ක්‍රියාවන් දැක, හදවතින්ම උපදින සතුට' යන අරුතද ගැබ්වී තිබේ.

ඔබලාත් ඒ ආකාරයට අන්‍යයන්ගේ යහපත් ක්‍රියාවන් දැකීමෙන් හා ඇසීමෙන් සතුටට පත්වනවා යැයි සිතමි. ස්වභාවික ව්‍යසනයන්ගෙන් ආපද වලට ලක්වූ ප්‍රදේශ වල ස්වෙච්චාවෙන් සහන සේවා කටයුතු කරන පුද්ගලයන් හා කොරෝනා වෛරසය හමුවේ ඉතාමත් කැපවීමෙන් කටයුතු කරන වෛද්‍ය අංශ වල පිරිසගේ ස්වරූපය රූපවාහිනියෙන් දකින් විට, සිතට ගෞරවයක් හා කෘතවේදීත්වයක් ඇතිවන පිරිස ඇතිවේ..

එසේම, සමහර අවස්ථාවන් වල එදිනෙද ජීවිතයේදී දකින ඉතා සුළු දෙයකින් පවා සිතට සතුට හා ප්‍රබෝධය ගෙන දෙන දේවල් තිබේ. එනම්, දුම්රිය මැදිරියක සිටි අවුරුදු 2 ක කුඩා ගැහැණු දරුවෙක්, එහි සිටි සියළුම මගීන් සමීපයට ගොස් හිස නවා ආචාර කල බවට එක් පුවත්පතක සදහන්ව තිබුනා. ධාවනය වන දුම්රිය තුල දරුවාට ඇවිදීමට ඉඩ හැරීම ගැන කවුරුත් කේන්ති නොගෙන, එම දියණියගේ යහපත් ක්‍රියාවට දුම්රිය මැදිරිය ආදරණීය බවින් පිරී ගොස් තිබුනා.

එසේනම්, වෛද්‍යය සේවයේ නිරතව සිටින පිරිස වේවා, දුම්රියේ සිටි කුඩා දියණිය වේවා, එවැනි දසුනක් දුටු විට අපගේ සිතට කෘතවේදි බවක් ඇතිවනේ, සිත ප්‍රබෝධයට පත් වන්නේ හෝ සතුටක් ඇති වන්නේ මන්ද?.

ඒ කුඩා දියණිය හා සමාන පරිශුද්ධ හදවතක් හා වෛද්‍යය සේවයේ නිරත පිරිස හා සමානව දුකට පීඩාවට පත් වූවන්ට උදව් කළ යුතුය යන හැඟීමක් අප තුල තිබෙන නිසාය. එය ක්‍රියාවෙන් නොකලත්, අන්‍යයන් කරන යහපත් ක්‍රියාවන් වලදී තමාද එයට සහභාගී වී සිටින බව දැනෙන නිසාය. එම හැගිම තුලින් ඉදිරියේදී එම ක්‍රියාවන් ප්‍රායෝගිකව සිදු කල යුතු ආකාරය ගැන සිතිය යුතුය.

# 'කෘතවේදීවීමට' අපට හැකි වන්නේ

මිනිසුන් සැමදෙනාම එකිනෙකට වෙනස් පෞරුෂත්වයකින්, අධිෂ්ඨාන ශක්තියකින් හා ශාරීරික ශක්තියකින් යුතු වන නිසා, කළ හැකි දේ පවා වෙනස් වේ. උදහරණයක් ලෙසින්, හැමදෙනාටම එක හා සමානව අන්‍යයන්ට උදව් උපකාර කරන සුපිරි ස්වෙච්චා සේවකයන් විය නොහැකිය. නමුත් ඇතිවන සතුට හා ප්‍රිතිය, ජීවිතයේ ශක්තිය බවට වෙනස් කරගනිමින් හා විශිෂ්ට දෙයක් හමුවූ විට 'කෘතවේදීයි' ලෙසින් තම කෘතවේදීත්වය පල කිරීමට හැකිවීම මනුෂ්‍යයන්ට ආවේණික විශේෂ ලක්ෂණයක් වේ.

එහෙත් හොදින් කල්පනා කර බැලූ විට, සත්වයන්ට හා ගස්වැල් වලට එසේ කෘතවේදී හැගීමට පත්විය නොහැකි වුවත්, ඔවුන් එකිනෙකා තම කාර්යභාරය නියමාකාරයෙන් ඉටු කරමින්, සමගියෙන් ජීවත්වේ. ඒත් මනසක් තිබෙන මනුෂ්‍යයන්, ඊර්ෂයාවෙන්, ක්‍රෝධයෙන් හා තෘෂ්ණාවෙන් මන්මුලාවී, අසමගිය නිසා පීඩාවෙන් ජීවත්වේ. මනුෂ්‍යයන්ටද කෘතවේදත්වයට පත්වීමේ ගුණය වඩවා ගැනීමට හැකිවන්නේ, ස්වභාව ධර්මය මෙන් සමගියෙන් සිටිමෙන් නොවේද. අපි එකිනෙකා සමගිය ආරක්ෂා කරමින්, පවුලේ අය සමග හා සමාජය තුල සාමකාමිව ජීවත්වීමට නම්, නිතරම 'කෘතවේදියි' ලෙසින් ස්තුතිපුර්වක වීම ඉතා වැදගත් වේ.

ඇතිවන සැම දෙයක්ම 'කෘතවේදියි' හා 'සතුටුයි' ලෙසින් නිහතමානිව භාරගැනීමෙන් හදවත සැහැල්ලුවට පත්වන බව අප සැවොම දන්නවා. එසේම, මිල මුදල් හා නිලතල තිබුනා හෝ නොතිබුනා වේවා නිතරම සතුට දැනෙන ආකාරයට නියම මනුෂ්‍යයන් වීමට ප්‍රාර්ථනා කරමින් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමටද උත්සහ ගත යුතුය.

එම සතුට හා ප්‍රිතිය අන්තර්ගත වු කවි පේලියක් 'කිච්ඡෝ මනුස්ස පටිලාභෝ - කිච්ඡං මච්ඡාන ජීවිතං' ලෙසින් ධම්ම පදයේ තිබේ. ඉතා දුෂ්කර වුවත් විශිෂ්ට මනුෂ්‍යය ජීවිතයක් අප ලබා සිටින නිසා, මනුෂ්‍යයෙකු ලෙසින් ජීවිතය ගත කිරීමෙන් ලැබෙන නියම සතුට 'පනස්වන පුද්ගලයා' දක්වා නිහතමානීව ප්‍රකාශ කරන විට නියම සතුටද පැතිරී යයි.

From *Kosei*, November 2020

# බුදුන් වහන්සේගේ මහා මෛත්‍රියේ හා කරුණාවේ මඟ පෙන්වීමෙන්

පියුන්ග් යුන් මහත්මිය
කොරියානු ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව,2019 වර්ෂයේ 12 වන මස 22 වන දින කොරියානු ධර්ම ශාඛාවේදී පැවැත්වූ නූපන් බිළිඳුන් වෙනුවෙන් සූත්‍ර සජ්ජායන දිනයේදී පවත්වන ලද්දකි.

සියළු දෙනාටම සුභ දවසක් වේවා. මම යොන්සාන් අනු ශාඛාවේ පියුන්ග් යුන්. නූපන් බිළිඳුන් වෙනුවෙන් පැවැත්වෙන සූත්‍ර සජ්ජායන දිනයේදී සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තුතිවන්ත වනවා.

මම 1969 වර්ෂයේ සෝල් වලදී, පියා පියුන්ග් ඉල්යුන්ග් සහ මව ජින් ඉන්ජා ගේ එක් පිරිමි දරුවෙකු සහ ගැහැණු දරුවන් තිදෙනාගේ වැඩිමහල් දියණිය ලෙස උපත ලැබුවා. මට වයස 24 දී පාර්ක් පොං ඉල් සමග විවාහ වී, දැන් මට වයස 25 ක දියණියක් සිටිනවා.

මම 2004 වර්ෂයේදී කෝසෙයි කායි සංවිධානයට බැඳුනා. එම කාලයේ, ව්‍යාපාරයෙන් පාඩු ලැබූ සැමියා ගම්බද හෝටලයක කළමනාකරුවෙකු ලෙස සේවයට ගියා. එම නිසා මට තනිවම ගෙදර වැඩ කරගැනීමට සිදුවුනා. නිවසේ ආදායම වෙනුවෙන් මමත් රැකියාවකට ගිය නමුත්, ජීවත් වීම ඉතා දුෂ්කරව දුකින්, මම හදවතේ තිබෙන තරහව, වෛරය යන සෑම දෙයකටම සැමියාට දොස් පැවරුවා. එම කාලයේ, දියණියගේ පාසලේ දෙමව්පිය හමුවකදී දැන හඳුනාගත් මාව සංවිධානයට හඳුන්වාදුන් ඉම්සුන් ජින්ග් පවුල් හෝසා නායිකාව සමග පවුල් අධ්‍යාපන සම්මන්ත්‍රණයකට සහභාගි වීම සඳහා පළමු වරට ධර්ම ශාඛාවට ගියා. ඇත්තටම පවුල් හෝසා නායිකාව කිහිප වරක්ම ශාඛාවට යාමට කතා කළද මම එය ප්‍රතික්ෂේප කළා.

පවුල් අධ්‍යාපන සම්මන්ත්‍රණයේදී කියාදුන් දේ මටම කියන්නාක් මෙන් දැනුනා. ව්‍යාපාරය කඩා වැටීම හේතුවෙන් දුකින් සිටින, පවුල් ප්‍රධානියාගේ කාර්‍යභාරය නිසි ආකාරව ඉටු කිරීමට නොහැකිව දුකින් පීඩා විඳින සැමියාට මම වෛර කරමින් සිටියා. දේශණය ඇසූ විට මම මා ගැනම පසු විපරම් කර, සැමියා කොයිතරම් තනියම පාළුවෙන් දුක් වන්නට ඇතිද යැයි සිතූ විට නොදැනීම මට ඇඩුනා. පවුල් අධ්‍යාපන සම්මන්ත්‍රණයට සහභාගි වීමෙන් පසු 'කෝසෙයි කායි සංවිධානය තරම් වටිනා සංවිධානයක් තවත් නැහැ' යැයි සිතා, ඉක්මනින් සාමාජිකත්වය ලබාගෙන, බුද්ධ රූපය (සෝකයිමියෝ) නිවසේ තැන්පත් කිරීම සිදුකලා.

ටික කලකින් සැමියා හෝටලයේ රැකියාවෙන් අස්වී, නැවතත් සෝල් වලට පැමිණියා. නැවතත් ආදායමක් නොමැතිව ජීවත් වීමට සිදුවුනත්, සැමියා පිළිබඳ තරහවක් වෛරයක් නොමැතිව, මම 'සැමියා නිවාඩුව සිටින කාලයේ, ධර්ම ශාඛාවට එක්කගෙන ගොස් ධර්මය ඉගෙනගෙන බලමු' යැයි සිතුවා.

ධර්ම ශාඛාවේදී, 'පුරුදු පුහුණු කලයුතු මූලික කරුණු 3 ඉගෙන ගත්තා.' මුලින්ම 'මෙය ප්‍රයෝජනවත් වන්නේ කුමකටද' යැයි මට නොදැනුනත්, එක් දිනක් ගෙදරදී වැසිකිළියට ගොස් පැමිණි සැමියා, වැසිකිළිය ඉදිරිපිට තිබෙන සෙරෙප්පු පිළිවෙලට තබන සැමියා දුටු විට, හදිසියේම විදුලි පහන් රාශියක් එකවරම දැල්වූවාසේ නිවස පුරාම ආලෝකමත් වන්නාසේ දැනුනා. ඉන් පසු වසර 10 ක් ගතවුන නමුත්, එදින සිදුවූ එම සිදුවීම පැහැදිලිවම මතකයේ තිබෙනවා.

සැමියා නැවතත රැකියාවට ගියත්, නව රැකියා ස්ථානයට හුරු වීමට නොහැකිව, විවිධ රැකියාවලට යමින් අස් වෙමින් සිටියා. සැමියා වෙනුවෙන් මට කිරීමට කිසි දෙයක් නොමැතිව එම සෑම අවස්ථාවකදීම, එම කාලයේ කියොකයිචෝ ලෙස සිටි ලී කියුන්ග් ජා උපදේශක තුමියගෙන් උපදෙස් ලබාගෙන, සැමියාව සහ තත්වය වෙනස් කිරීමට සිතා සිටින මාගේ හදවත වෙනස් කිරීමට හැකිවුනා.



*කොරියානු ධර්ම ශාකාවේ දී සෙප්පෝව ඉදිරිපත් කරන යුන් මහත්මිය*

ලී උපදේශක තුමිය දුන් උපදේශයට විරුද්ධව යමින් නැවතත් ව්‍යාපාරයක් පටන්ගත් සැමියා, විශාල වංචාවකට ගොදුරු වී විශාල ණයකට හිරවුනා. ජීවත්වූ ගෙදරින්ද යාමට සිදුවී, අපි සැමියාගේ මවගේ නිවසේ පදිංචියට ගියා.

සැමියාගේ මවත් අක්කලාත්, මාගේ බුදු කුටිය දැක පුදුමයට පත්ව ගෙදර විශාල කලබලයක් ඇති වුනා. අයියලා 3 දෙනෙක් සහ අක්කලා 3 දෙනෙකුගෙන් යුත් පවුලේ මාගේ සැමියා බාලයා විය. සැමියාගේ අක්කලා සැමියාට මුකුත් නොකියා, මට විතරක් බැණ වදිමින්, බුදු කුටිය ඉතා ඉක්මනින් අයින් කරන ලෙස කියා සිටියා. සැමියාගේ පවුලේ අය ධර්මය පහත්කොට සැලකූ නිසා තරහෙන් සිටින් මා හට 'පළමුව ගෙදර සාමය වැදගත්' යැයි ලී උපදේශක තුමිය කරුණාවන්තව කරුණු පැහැදිලි කර දුන්නා.

බුදු කුටිය ප්‍රතික්ෂේප කරන සැමියාගේ පැවුලේ අය දැක, මාගේ ධර්ම මාර්ගය පිළිගත් මාගේ දෙමව්පියන්ට නැවතත් ස්තුතිවන්නට අවස්ථාව උදවුනා. මමත් පැරදීමට කැමති නැති නිසා, 'බොරු කීමත් උපාය කෞෂල්‍යය' යැයි මටම කියා ගනිමින්, 'රැකියාවට ගිහින් එන්නම්' යැයි පවසමින්, මම සෑම උදෑසනකම ගෙදරින් පිටවී ධර්ම ශාඛාවට ගියා.

වසරකට පමණ පසු, මූලස්ථානයේදී බුද්ධ ප්‍රතිමාව ලබාගත් අය සහ පවුල් හෝසා නායකයන් සමග සසඳන විට, මම මගේ ධර්ම පුහුණුවේ එකතැන පල් වෙනවා යැයි සිතුනා. සියල්ල මාගේ නොහැකියාව යැයි සිතා, අනික් අතට සැමියාගේ අක්කලා නිසා මට ඉදිරියට යා නොහැකියි යන හැඟීමත් නිසා සැමියාගේ පවුලේ අය පිළිබඳ තිබූ හැඟිම එන්න එන්නම නරක අතට හැරුනා. අනෙක් අතට මාගේ හදවතේ ලැජ්ජා සහගත හැඟීම නිසා, ලී උපදේශක තුමියගෙන් උපදෙස් ලබා ගැනීමට උවමනා වුනත් උපදෙස් පැතීමට ධෛර්‍යයක් නොමැතිව උපදෙස් ලැබා ගැනීමට නොහැකි වුනා. මේ හැඟීම කාටවත් කීමට නොහැකිව, සිදුවනදේ අවංකව පිළිගැනීමට නොහැකි තත්වයට පත්වුනා. ධර්ම ශාඛාවට නොයන තත්වයට පත් වූ මම, නැවතත් රැකියාවට යාමට පටන් ගත්තා.

2015 වර්ෂයේ 2 වන මස 7 වන දින, අසනීපයට පත්වූ ලී උපදේශක තුමිය අභාවප්‍රාප්ත වුනා. මාගේ නිවස ගැන ලී උපදේශක තුමිය විමසිල්ලෙන් සිටියා වුනත්, ධර්ම ශාඛාවෙන් ඈත්ව, ධර්මය කරාම ඈත්ව සිටි නිසා මට ඇයව බැලීමට යාමටද නොහැකිවිය.

රැකියාව නිසා, ඉන් පසුවද ධර්ම ශාඛාවට යාමට හැකිවූයේ සති අන්තයේ සහ නිවාඩු දිනදී පමනයි. ලී කියුන්ග් ජා උපදේශක තුමිය මිය යාමෙන් පසු කියොකයිචෝ ලෙස පත්වූ ලී හන්ග් ජා කියොකයිචෝ සාන්ගේ ධර්මය ඇසූ විට, මට ලොකු ප්‍රබෝධයක් දැනුනා. නමුත් රැකියාවේ මහන්සියත් නිසා නිවාඩු දිනදී ධර්ම ශාඛාවට යාමට නොහැකිව, තවත් වසරකට වැඩි කාලයක් ධර්ම ශාඛාවට නොයා සිටි කාලයක් තිබුනා. සාමාජිකයන් පිළිබඳ මාගේ හැඟීම ක්‍රමයෙන් මැකී යන්නට වුනා.

රැකියා ස්ථානයේදී මුලදී ධර්මයට අනුව පුද්ගලයන් සමග කටයුතු කලත්, ක්‍රමයෙන් තරහව පාලනය කර ගැනීමට නොහැකිව හැඟීම් වලට වහල්ව කටයුතු කිරීමට පටන් ගත්තා. 'මෙහෙම හරියන්නේ නැහැ' යැයි සිතා, නැවතත් ධර්මය ඉගෙන ගන්න ඕනා යන සිතුවිල්ලෙන්, වසර 6 ක කාලයක් රැකියව සිදුකල රැකියා ස්ථානයෙන් ඉවත්වී ධර්ම ශාඛාවේ පැවැත්වූ දවස් 21 ක සූත්‍ර සජ්ජායනයට සහභාගි වී, සෑම දිනකම හෝසාවටද සහභාගි වුනා.

එම වර්ෂයේ 12 වන මස නූපන් බුළිදුන් වෙනුවෙන් පැවැත්වෙන සූත්‍ර සජ්ජායනටද සහභාගිවුනා. ලී කියොකයිචෝ සාන් 'සියළු දෙයක්ම ඔබ සුභ වාදීව භාරගන්න' යැයි කියාදුන් දෙය, 'අවට සිදුවන සෑම සිදුවීමක්ම තමාගේ වර්ධනයට වැදගත්වන, බුදුන් වහන්සේගේ කරුණාවෙන් ලැබෙන ස්තුතිවන්ත දේ යැයි භාර ගැනීමයි' යන උපදේශය මාගේ හදවතේ තැන්පත් වුනා. මීට පෙර කිසියම් ප්‍රශ්ණයක් ඇතුවූ විට 'සෑම දෙයක්ම මාගේ වගකීමක්. මමයි වැරැද්ද කලේ' යැයි පසුගාමීව සිතමින්, ධර්මයට අනුකූලව බැලුවේ නැහැ. මාගේ අදහස් වලින් ඔළුව පිරී අන් අයගේ දේට ඇහුන්කන් නොදී, නිවරදි දේ තේරුම් ගැනීමට නොහැකිව විශාල දුකකින් පීඩාවකින් සිටි බව වැටහුනා. තමා සිතා සිටින ආකාරයටම දේවල් සිදු නොවන විට, 'මෙයත් මාගේ වර්ධනයට බුදුන් වහන්සේගෙන් ලැබුන ස්තුතිවන්ත අවස්ථාවක්' ලෙස සුභ වාදීව භාර ගැනීමට හැකිනම්, දුක් වේදනාවන්ගෙන් බේරීමට තව දුක් වේදනා වලට ආරාධනා නොකර, වෙනත් ආකාරයකට දෙවනි තෙවනි ඊතල භාර නොගන්නා ලෙස ඉගෙන ගත්තා.

මම මේ 'සාමයෙන් පිරී තිබෙන ධර්මය' තව තවත් ඉගෙන ගන්නා ඕනා යැයි සිතා, සෑම දිනකම උදෑසන සහ දහවල් කාලය ධර්ම ශාඛාවේදී ගත කිරීමට පටන් ගත්තා. ඒ වාගේම ජීවත්වීම සඳහා සවස් කාලයේ සවස 5 සිට 11 තෙක් අර්ධ කාලීන රැකියාවක නියලී, මධ්‍යම රාත්‍රියේ ගෙදරගොස් පාන්දර 1 පසු වී නින්දට යාම දෛනික පුරුද්දක් බවට පත්විය.

මේ අතර, හොඳින් ජීවත්වීමට හැකි, රැකියාවක් කිරීමටද අවශ්‍යතාවක් නොමැති, ඇති තරම් කාලය කැප කිරීමටද හැකි අය ධර්ම ශාඛාවේ රාජකාරි ප්‍රතික්ෂේප කිරීම දුටු විට මට තරහා යනවා. එම හැඟීම හෝසාවේදී ඉදිරිපත් කල විට, 'සැප පහසු ජීවිතයක් යනු, මුදල් සහ කාලය ඇති තරම් තිබෙන, විනෝද වීමට යෑම, රසවත්

ආහාර ගැනීම නොව, සෑම දෙයකටම හසු නොවන නම්‍යශීලී මනසකින් ජීවත් වීමයි' යැයි ඉගෙන ගෙන ඒ සඳහා නොවෙනස්ව කටයුතු කිරීමට සිතා ගත්තා.

සැමියාගේ රැකියාවේ ප්‍රශ්ණ, ගෙදර ආර්ථික ප්‍රශ්ණ තවමත් විසඳී නැත. වර්ථමානයේ සැමියාට රැකියා ස්ථානයෙන් මාස 3 ක වැටුප ගෙවා නැත, නැවත රැකියාව අහිමි වේවිද නොදනී. මෙපමණ ධර්මය පුරුදු පුහුණු කරත් ඇයි ප්‍රශණ ඉවර නොවන්නේ යැයි සිතා මම මා දෙසම නැවත හැරී බැලුවා. එසේ කලවිට, මතුපිටින් හෝසා වලදී කතාබහ කලත්, ධර්මය පුරුදු පුහුණු කරමින් ධර්මයේ හැසිරෙනවා යැයි පෙනුනත්, හදවත තුල ප්‍රශ්ණ ගැටලු අනාගතය ගැන සිතමින් සිත නොසන්සුන්ව සිටින මාව වටහා ගත්තා. එමෙන්ම පේරට වඩා ටිකක් වෙනස් වනුයේ, සැමියාගේ හැසිරීම වටහා ගැනීමට හැකි වීමත්, සැමියා ගැන කණගාටුවක් නොමැති වීමත්ය. පවුල වෙනුවෙන් රැකියා ස්ථානයේ වෙහෙස මහන්සිව කටයුතු කරන මාගේ ස්වාමියාට බොහොමත්ම ස්තුතිවන්ත වනවා. බිරිඳ ලෙස මට තිබෙන රාජකාරිය වනියේ සැමියාව විශ්වාස කරමින් කටයුතු කිරීමයි. මම මුළු හදවතින්ම ධර්මය පුරුදු පුහුණු කිරීමට සිතා සිටිනවා.

මම ආදරයෙන් රැකබලාගෙන ආ දියණියක් සිටිනවා. සමාජයට ගොස් ඇයට තනිවම කටයුතු කිරීමට හැකි වේවිද යැයි බියක් තිබුනත්, ඇය තමාගේ රාජකාරි වෙහෙස මහන්සිව සිදු කරමින් හොඳ දියණියක් ලෙස හැදී වැඩුනා. ඒ වාගෙම මව වන මා ගැන සොයා බලන විශ්වාස්නීය දියනියකි. මම කෝසෙයිකායි සංවිධානයට බැඳී කටයුතු නොකලානම් , මට ඇයව හොඳින් හඳුවඩා ගැනීමට නිහැකි වේවි.

මම, මවක් ලෙස දරුවන්ට 1 සිට 10 තෙක් සියළු දේ කර දිය යුතු යැයි සිතා සිටියා. එය කිරීමට නොහැකිව, උදාහරණයක් ලෙස දරුවෙකු ලැබීමට සිටියත්, දරුවාට උපත නොදුන්නානම් දරුවාට හොඳ යැයි සිතා සිටියා. එම නිසා මේ නූගත් මවගේ ගර්භාෂයේ රැඳී සිටියද, මෙලොව එළිය දැකීමට නොහැකි වටිනා ජීවිත වලට මෙය අවස්ථාවක් කරගෙන මම බොහොමත්ම සමව අයදිනවා, මම හදවතින්ම ඒ ගැන කණගාටු වනවා.

2019 වර්ෂයේ 4 වන මස කියොකයිචෝ සාන්ගේ උද්වීවෙන්, ජපානයේ පැවැත්වූ 'නැගෙනහිර ආසියාවේ ධර්ම නායක පුහුණු පාඨමාලාවට' ධර්ම ශාඛාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු ලෙස සහාභාගී වුනා. රාත්‍රී 5 ක් සහ දින 6 කින් යුත් කාලසටහනේ කොරියන්, තායිවාන්, මොන්ගෝලියා යන රටවලින් 15 දෙනෙකු සහභාගි වී, ඉතාම සතුටුදායක කාලයක් ගත කිරීමට හැකිවුනා. සංවිධානයේ මූලික සංකල්ප ප්‍රධාන කොටගෙන, කෝසෙයිකායි සංවිධානයේ රාජකාරි සහ එහි වැදගත්කම, තෙදොරි, ඩෝජෝ තෝබන්, හෝසා පිළිබඳ ඉගෙනගන්න අතරතුර, ජපානයේ සහ කොරියාවේ දුෂ්කරතාවයන් තිබියදීත් නික්යෝ නිවානෝ තුමාගේ ධර්මය කොරියාවට කියාදුන් ලී කියොකයිචෝ සාන්ට සහ වර්ථමාන කියොකයිචෝ සාන්ට ස්තූතිවන්ත වෙමින්, ජපානය සහ කොරියාව අතර පාලමක් ලෙස ක්‍රියාකාරී කල ලී උපදේශක තුමාගේ උත්සහය සහ වටිනාකම අවබෝධ කරගත්තා.

නැන්දම්මාගේ නිවසේ ජීවත් වීමට පටන්ගත් මුල් කාලයේ, ගෙදර බුදු කුටිය තැබීමට විරුද්ධ වූ නිසා, දැන් කිරීමට හැකි දේ කරමු යැයි සිතා, සෑම මාසයකම ධර්ම ශාඛාවේ කයිමියෝ කමරයට ගොස් මියගිය මුතුන් මිත්තන්ගේ නම් කියමින් සූත්‍ර සජ්ජායනය සිදුකලා. එසේ කල විට ගෙදර බුදු කුටිය තන්පත් කරන්න ඕනා යැයි සිතා, පවුලේ අය එයට විරුද්ධ වුනොත් මම ගෙදරින් යාමට සිතා, මුලින්ම මේ ගැන සැමියා සමග කතාබහ කලා. එවිට සැමියා මාව තේරුම් ගත්තා. ඉන්පසු, මෙවර 4 වන මස, සැමියාගේ නුවසේ බුදු කුටිය තැන්පත් කලා. නැන්දම්මා සහ සැමියාගේ අක්කලාගේ හැසිරීම පිළිබඳ කනස්සල්ලක් තිබුනත්, සූත්‍ර සජ්ජායනා කර බුදුන් වහන්සේට, මුතුන් මිත්තන්ට සුභ ප්‍රාර්ථනා කිරීමෙන් හදවත ආලෝකමත් වුනා.

නව කොරෝනා වෛරස ආසාදනය වැලැක්වීම සඳහා, ධර්ම ශාඛාවේ ගොමෙයිනිචි වැඩසටහන් සක්‍රියව නොපැවැත්වෙන මේ කාලයේ ගෙදර බුදු කුටිය තිබීම කොයිතරම් ස්තූතිවන්තද, යන්න වචන වලින් කීමට නොහැකිතරම්ය. උදේ සවස සූත්‍ර ස්ජ්ජායනය කල විට, හදවත සන්සුන් වී, සාමකාමී හැගීමකට පත් වෙනවා.

මම බොහෝ වාරයක් ක්‍රියාකාරීව හදවතින්ම වැඩ කර සිටියත් වෙහෙසට පත්ව දේවල් බාගයට කර අතහැර දමන අවස්තා තිබෙනවා. නොපසුබස්නා උත්සාහයෙන්, ක්‍රියා කරන මාව සංවිධානයට හඳුන්වාදුන් ඉම් පවුල් හෝසා නායිකාවගේ පිහිටෙන්, මෙතෙක් කාලයක් කෝසෙයිකායි සංවිධානය සමග බැඳී කටයුතු කිරීමට හැකියාව ලැබුනා.

මමත් මිච්බිකි කල කිහිප දෙනෙක් සිටින නමුත්, හයෂි පවුල් හෝසා නායිකාවගෙන් ඉගෙනගෙන නොපසුබස්නා උත්සාහයෙන් මින් ඉදිරියටත් තව එක් අයෙකු හෝ මිච්බිකි කිරීමට කටයුතු කරනවා.

ධර්මයේ පිහිටෙන්, මිනිසුන් ගැන සිතමින්, ආලෝකමත් හදවතකින්, සිනාමුසු මුහුණින් අන් අය සමග කටයුතු කිරීමට හැකි වීම, ඒ වාගේම රාජකාරි කිරීමේ පිහිටෙන් මිනිසුන් වෙනුවෙන්, සමාජය වෙනුවෙන් කැපවී කටයුතු කරන පුද්ගලයෙකු බවට පත්වීමට හැකිවීම ගැන හදවතින්ම ස්තූතිවන්තවනවා. මේ ලොකයේ ඉපිද, මේ ආකාරයට හමුවී, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීමට හැකිවීම ඉතාමත් විශිෂ්ඨ ලෙස ජීවිතය ගත කිරීමට හැකිවේවි යැයි සිතනවා.

බුදුරජාණන් වහන්සේටත්, නික්යෝ නිවානෝ තුමටත් බොහොම ස්තූතියි. නිච්කෝ නිවානෝ තුමාටත්, සාමාජිකයන් සියළු දෙනාටත් බොහොම ස්තූතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 19 වන පරිච්ඡේදය, ධර්මාචාර්යවරයාණන් ලබන ආනිශංස

### සය ඉන්ද්‍රියන් පිරිසිදු කර ගැනීමෙන් ලැබෙන ආනිශංස

මෙම පරිච්ඡේදයේදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිගෙන ධාරණය කරගනිමින්, කියවමින්, සජ්ඣායනා කරමින්, විග්‍රහ කරමින් හා පිටපත් කිරිම නියමාකාරයෙන් කරන්නවු පුද්ගලයන්ට ඇස්, කන්, නාස, දිව, ශරීර හා මානසික යන ශඩ් ඉන්ද්‍රියන්ගෙන් ලැබෙන්නාවු ආනිශංස ගැන විස්තරාත්මකව සදහන් වේ. එහි සදහන් දෑ වර්තමාන වැසියන්ට පුදුම සහගත ලෙසින් පෙනෙන්නට පුළුවන්. නමුත් එහි ඇති සත්‍යතාව හොඳින් ග්‍රහණය කරගත යුතුයි සිතමි.

### බෝධිසත්වයන් වහන්සේලාගේ සතර නිර්භයන්

බුදුන් වහන්සේ විසින් ශඩ් ඉන්ද්‍රියන්ගේ ආනිශංස ලෙස මුලින්ම ඇසෙන් ලැබෙන ආනිශංස ගැන සදහන් කර ඇත. ඒ තුල ඇති පද පෙලක 'නොබියව මේ මල් දම් සුතුර දෙසුවෝතින් - සවිතරව මම පැහැදිළි කර දෙන්නම් - මතු බවයෙදි උන් ලබන මහ පින් බලයන් ' සේ සදහන්ව ඇත.

ඈත අතීතයේ සිට 'සතර නිර්භයන්' ලෙස බෝධිසත්වයන් වහන්සේලාගේ නිර්භීත බව ගැන සදහන් කරයි. එනම්, 'භීතියෙන් හෝ පැකිලීමකින් තොරව, තමා විශ්වාස කරන දේ දේශනා කිරිමේ හදවතයි'. එය 'බුදුන් වහන්සෙගේ' සතර නිර්භයන්ට' අනුරූප වේ. ධර්මය නොමැති යුගයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචලිත කිරිමට උත්සහ කරන බෝධිසත්වයින්ට මෙය ඉතාමත් වැදගත් වේ.

පළවෙනි නිර්භය, 'සම්පුර්ණයෙන්ම ග්‍රහණය කරගැනීම හා නැවත මෙනෙහි කිරිම' වේ. එහි අදහස නම්, තමා ඇසූ සියළුම ධර්මය අමතක නොකර හොඳින් ග්‍රහණය කර මතකයේ තබාගෙන, නැවත මෙනෙහි කරමින් ඕනෑම කෙනෙකුට ධර්මය කියාදීමට පසුබට නොවී නිර්භීතව ධර්මය දේශනා කිරීමට කටයුතු කිරිමයි.

දෙවෙනි නිර්භය, 'සියළුම ධර්ම ඖෂධයන් ගැන මනා දැනුම' වේ. එහි අදහස නම්, සෑම සියළු සත්වයෙකුගේම ගතිගුණ හා හැගීම එකිනෙකට වෙනස් නිසා, එයට ගැලපෙන ආකාරයට ධර්මය නැමැති බෙහෙත හරි ගානට නියම කිරීමට හැකි නම්, නිර්භීතව ධර්මය දේශනා කිරීමට හැකිවේ.

තුන්වන නිර්භය, 'ප්‍රශ්න ඇසීමට හා පිලිතුරු දීමට ඇති හැකියාව' වේ. එහි අදහස නම්, ඕනෑම ගැටලුවකදී හෝ ප්‍රතික්ෂේප කිරීමකදී ධර්මානුකූලව පැහැදිලිව, හේතු කාරණා



දක්වමින්, කවුරුත් සෑහීමකට පත් වන ආකාරයට පිලිතුරු දීමට හැකි නම්, නිර්භයව ධර්මය දේශනා කිරිමට හැකිය.

සිව්වන නිර්භය, 'සැකයන් විසදීමේ හැකියාව' වේ. එහි අදහස නම්, සෑම සියළු සත්වයෙකුම දුකින් මුදවා ගනිමු යන බුදුන් වහන්සේගේ මහා මෛත්‍රිය හා කරුණාවේ හැගීමට පත්ව, ඇති වී තිබෙන සුළු හෝ සැකයන් වලදී 'බුදුන් වහන්සේගේ නියම අභිප්‍රාය මෙය වේ' ලෙසින් පැහැදිලිව සැකයන් විසදීමට හැකි නම් නිර්භයව ධර්මය දේශනා කිරිමට හැකිය.

නමුත් මේ දෙස බැලු විට ධර්මය දේශනා කිරිම පහසු දෙයක් නොවේ යනුවෙන් බිය වන පුද්ගලයන් සිටීමට හැකිය. එහෙත් බිය නොවිය යුතුය. මන්ද මෙහි සදහන් කර ඇත්තේ ධර්ම දේශකයෙකුගේ තිබිය යුතු පරමාදර්ශී ස්වරූපය වේ. මේ තත්වයට පත් වීමට හැකිනම් ඒ ශ්‍රේෂ්ඨ බෝධිසත්වයන් කෙනෙකු වේ. නමුදු ඒ කිසිම ශ්‍රේෂ්ඨ බෝධිසත්වයන් කෙනෙකු මුල සිටම එසේ ශ්‍රේෂ්ඨත්වයට පත්වුවා නොවේ. ඉතා දිර්ඝ කාලයක් ගත කරමින් වැරදී අතපසු වීම් හා නොයෙකුත් අත්හද බැලීම් තුල නොකඩවා කල උත්සහයෙන් එම තත්වයට පත්වුනා වේ.

එබැවින් බෝධිසත්වයන් ලෙස ධර්ම පුහුණුවේ යෙදෙන අපි, මෙම සිව් නිර්භයන් නිතරම හදවතේ තබා ගනිමින්, ධර්මය දේශනා කිරීම පමණක් ප්‍රමාණවත්ය. පිලිතුරු දීමට අසීරු දුෂ්කර ගැටළු වලට මුහුණ දුන් විට, 'මේ ප්‍රශ්නයට මේ අවස්ථාවේම පිලිතුරු දීමට මට හැකියාවක් නැහැ. ඒ ගැන තවත් හොඳින් සොයා බලා හෝ දන්න

කෙනෙකුගෙන් අසා පසුවට පිලිතුරු දෙන්නම්' ලෙසින් එම ප්‍රශ්නය මග නොහැර අවංකව පිලිතුරු දිය යුතුය.

එසේ පිලිතුරු දීමෙන් ධර්ම දේශකයා අඩු තක්සේරුවට පත්වෙනවා නොව, අසා සිටින පිරිස තුල ධර්ම දේශකයා කෙරෙහි ඇති විශ්වාසය වැඩි වේ.

## එදිනෙදා ජීවිතය ධර්මයට අනුකූල වන ආකාරයට

මෙම පරිච්ඡේදය තුල නොසලකා සිටිය නොහැකි වාක්‍යයක් තිබේ. ඒ 'ඔවුන් යම් දෙයක් උගන්වන්නේද නැතහොත් දේශපාලනික ලෝකය පිළිබඳව කතා කරන්නේද නැතහොත් ජීවිතය හා සම්බන්ධ වූ යම් දෙයක් පිළිබඳව කතා කරන්නේද ඒ සෑම අවස්ථාවකම සත්‍ය වූ ධර්මයට එකඟවම ඒ දෙය කරයි' යනුවෙනි. එය තවත් පැහැදිලි කරනවා නම්, 'නම් පුද්ගලයෙකු, එදිනෙදා ජීවිතය පිලිබඳව කියා දෙන්නේද, දේශපාලන ලෝකය ගැන කතා කරන්නේද, ව්‍යාපරික උපදෙස් ලබා දෙන්නේද, ඒ සෑම දෙයක්ම ධර්මානුකූල විය යුතු' බවයි.

සැබෑ ධර්මය කිසිසේත් පුද්ගලික අධ්‍යාත්මයට පමණක් සීමා වුවක් නොවේ, සමාජමය වශයෙන් ව්‍යාප්ත වුවකි. එසේම එදිනෙදා ජීවිතය නියමාකරයෙන් ගත කිරීමට ධර්මය පාදක වේ. එසේ නොමැති නම් සියළුම සත්වයින් නියමාකරයෙන් මුදවා ගැනීමට නොහැකිවේ. එම කරුණ හදවතින්ම තදින් බද්ධ කරගත යුතුය.



නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』ග්‍රන්ථය ඇසුරෙනි

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P183-P187

# Director's Column

## කළගුණ දැක්වීම සහා බෝධිසත්ව අධිෂ්ඨානය

අවුරුද්දේ අවසානයත් ළඟා වුනා. කොරෝනා ව්‍යසනය නිසා වෙනදට වඩා වෙනස් ආකාරයට ජීවිතය ගත කළා වුනත්, ඒ තුල නව සොයා ගැනිම් රාශියක් තිබුනා යැයි සිතමි.

නිචිකෝ නිවානෝ තුමාගේ නොවැම්බර් මස මාසික පණිවුඩය 'කෘතවේදීත්වය පැවසීමට හැකිවීමෙන් ලැබෙන සතුට' වේ. සතුටින් පින් අනුමෝදන් කිරීම පරිච්ඡේදයේ 'පනස්වන පුද්ගලයා දක්වා ධර්මය කියා දීම' හි කොටසක් උපුටා ගනිමින්, සතුටින් පිරි හදවතේ අරුථ ගැන එහිදී පැහැදිලි කර දුන්නා. එසේම, අපි එකිනෙකා තුල තිබෙන බුදුන් වහන්සේ හා සමාන යහපත් දේ කළ යුතුයි යන හදවත අවබෝධ කරගෙන, ජීවිතයට කෘතවේදී විය යුතුය. ඒ තුලින් මනුෂ්‍යය ජීවිතයක් ලැබීමේ සතුට නිහතමනීව අන්‍යයන්ට ප්‍රාකශ කිරීමේ වැදගත්කමද ඉගෙන ගත්තා.

පසුගිය මස පැවැත්වු නිර්මාතෘ තුමාගේ ජන්ම දින සැමරුමත් සමඟ එහුමාට කළගුණ දක්වමින්, ඉදිරි ධර්ම ව්‍යාප්තිය සඳහා අධිෂ්ඨානයන් ඇති කර ගනිමු.

කෝයිචි සයිතෝ මහතා
ප්‍රධානී, අන්තර්ජාතික මුලස්ථානය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp